# නිර්මාණ Nirmana

## අවසන් සටන

අවි ආයුද තිබූ තැනකට මෙවැනි ගොඩක්
නොබියව ගිහින් නොතබා යන සිදුරු කඩක්
රණ විරුවන් කළේ නගමින් විජය හඬක්
දස මහ යෝදයින්ටත් කළ නොහැකි වැඩක්

හිස් ගෙඩි දෙපලු කොට කුරුමාණම අල් ලන්
පාගා දමනු මිස සතුරා බිම පෙල් ලන්
ආපසු හැරෙන්නට දුටු විට යුද සෙල් ලන්
ලක් මැණියන් බිහි කොට නැත බිය ගුල් ලන්

විස් කම් පාන්නට ගොස් වන පෙතක රවුම්
පුස් සක් කරන ලද ලෝකෙට කියපු කිවුම්
ගස් වැල් පවා වියලී යන දැඩිව තැවුම්
පස් වෙන්නවත් හොඳ නැත ලක් පොළවෙ මෙවුන්

සමගිය සතුට අගයන බොදු මගක් මත
ගමකින් ගමක ගංටාරෙක හඬක් ඇත
කමකට නොමැති අලුගෝසක අසික් කිත
මෙම පාපින්ට ලක් පොළවේ ඉඩක් නැත

ඉන්නට යමක් ඇති විදියට අතේ මිටේ
ජාතින් ගසා ඇත එකමුතු කමේ ගැටේ
ගම්බිම් අපේ මය මව්බිම පිරී වටේ
මින් පසු නොමැත මායිම් ගම් අපේ රටේ

සිල්පය හොඳින් දත් රණවිරුවන් වීර
සිහිකොට ත්‍රස්තයන් කළ හැටි සං හාර
සයිරන් නලා වෙනුවට අපි ගං ටාර
හඬවමු මෙයින් පසු හැඟුමින් ගම් බීර

හැංගෙන තැනක් නැති මහ වැලි තලා මැදින්
හොය හොය වන ලැහැබ් කොටි වනසනා හදින්
රණවිරු පුතුන් ගිය හැටි ජය මගේ හොඳින්
සෙල් ලිපියක් කරමු අපි හදවතේ තදින්

♦ **කිව්පති පාතකඩ කුලතිලක**
Maharagama **Sri Lanka**

## මද්‍රි බිසෝ

දෙ න ය න විලස රැකගෙන දිවි දෙවෙනි කොට
සැ ම දි න පෙමින් උන් ඇති දැඩි කළ මෙමට
නොදැනෙන ලෙසට දරුවන් දී බමුණෝ කුට
සැ න සෙ න අයුරු පවසන්නේ දැන් කුමට

හද පින වන වදන් මුදු දෙසවන පහසී
ලබමින වැඩුණු මුත් දැන් වෙති දස් දැහැසී
කිසිදින අසා නුපුරුදු සැඩ බස් වහසී
අද දින උන් හඬනු ඇත අසමින් වෙහෙසී

කිසි විට නිය පිටින් වත් පහරක් නොලද
මගෙ දරු ලබනු ඇත අද ගුටි බැට නොමද
සිහිවන හැම විටෙක ගෙන දෙයි සිතට වද
හිමියනි දරු සොවින් නොපැළී යයිද හද

ක ර පිනවා ගතිමි පෙර උන් යන මගට
ත ර කොට බැඳන් ඇදගෙන යනු ඇත මෙවිට
ගොර හැඩි ගල් බොරළු පැගී මග දිගට
ක ර ගැට නැගෙනු ඇත මුදු පා පතුල් යට

නි ද හ ස් සුවය විඳ කෙළ පැන හුනද පෙර
දැසි දැස් සන් බවට පත්කොට කළ නපුර
උ ද හ ස් බමුණුගෙන් ලැබෙතැයි අනව සර
අ ද හ ස් පවසන්ට බිය වෙති උන් මෙවර

ග ත දැඩි වෙත ඉවසා බැරි තැන දිනෙක
ඇත මගෙ පුතු කරනු බමුණුට එකට එක
සි ත නැත එම එඩිය වෙත දියණිය මෙලෙක
පු ත වුණි නම් හොඳයි ඇය මට නැතිය සැක

රුදු වන ඔබ අනුව නොඅසා ඔබගෙ සිතු
වැදූ නෙමි දරු සමග හිමියන් පෙරුම් පැතු
බු දු වෙන්නට පතාගෙන ඔබ දිනෙක මතු
පි දු වෙද දෙරු එබැවින් මට වරද සතු

දෙනු වන කඳුළු නැත වැළපෙන්නට මෙමට
හුණු වන ලයක් නොමැතිද හිමියනි ඔබට
අ නු වම දෙදරුවන් ගොර දුක් විඳින් නට
දෙනු මැන පිණට මගෙ කුණු කය බමුණෝ කුට

♦ **වෛද්‍ය උපාලි අබේසිරි**
**Middx UK**

## නොවැටහීම

හදවතින් ගව් ගණන් දුරස් වී
එකම සෙවනක රැඳී
හිඳීමෙන් පලක් නැත මේ ලෙසින්
ලොවේ සුන්දරත්වය
දකින දෙනෙතක් හිමි වුනත් ඔබට
මගේ සිත විනිවිදව දකින්නට
නොහැකි විණ

සිත උපන් මුදු හැඟුම්
තලා පොඩිකර දමා
සැහැසි ලෙස මගෙ සිතුම් සිඳ දමා
ඔබේ රළු දැත් මත මිලින වී
මිය ඇදුණු හදවතින්
හිඳිමි මම
පිළිසරණ අයැදිමින්
සම්මතයෙ පවුර ළඟ

♦ **සන්ධ්‍යානි සේනාරත්න**
Surbiten Surrey **UK**



**නොබෝදා අභාවප්‍රාප්ත
ප්‍රේමා අදිකාරි මහත්මිය**



**Sarah Siddons (1755-1831)**
**Great Shakespearean actress of the 18th century, is buried in the placid churchyard of St. Mary's, Paddington Green, London. The 1897 marble statue by Leon-Joseph Chavalliaud (1858-1921) was unveiled by Sir Henry Irving.**

## සිඩන්

පැඩින් ටන් ග්‍රීන් පාරෙහි අසල බඳ
හඬින් යුතු කුරුළු ගී රැව් දෙන නිබඳ
උඩින් අතුපතර දස අත යන විහිද
සිඩන් හිඳියි මේ පල් තුරු උයන මැද

හැඳ සුදු සිනිඳු සළු බඳු සුළඟෙහි ලෙලෙන
බැඳ ගෙළ මාල හිස ඔටුණු ද පැළඳ ගෙන
හි ඳ සැප පහසු ලෙස කිරිගරුඬ සිහ සුන
ර ඳ වයි අත අවිය රජු නසන අටි යෙන

සුපතල වේදිකා නිළි රැජිනිය විලස
රඟ පා මැක්බත්හි නැංවිය සිය යසස
ලොව තුළ කලාකරුවන් හට ඇති වෙසෙස
විදහා පාති බඳවා පිළිරු මෙලෙස

♦ **සේපාලිකා ජයසිංහ**
**Middx UK**

## Kensington Garden's Round Pond

Away from dull, tediously incessant roar of traffic
Interspersed by blaring Klaxons and shrill sirens
A shimmering oasis for stately, placid swans
Garrulous ducks restless, sly, diving cormorants
Flocks of migrant Canada geese….
On a hot Summer's day, beneath a cloudless navy-blue sky
I stroll around the pond……
Then high above the park I see a shining
Steeply climbing silver arrow-head - a fighter jet.
It's twin white vapour trails blur, then vanish in the pellucid air
Like vignettes of memories
Or half remembered dreams

♦ **Denis Jansz** - ***London NW8***

## නිහඬ

වෙනස්වද නැවුම්වද
ගලයි දිය
ඉවුරු නිසලය
වෙනස්වද නැවුම්වද
ගලන හඬ
ඉවුරු නිහඬය
ඉඩ සදම්
සිතුවිලිවලටත්
ගලන්නට ඒ විලස
සිත නිහඬ වී
බලා හිඳීවි එවිට

***එන්. ඩබ්. පී. ලාල්***

## ලංකාවිත්තියට ආසිරි !

සිටියදි විදෙස් ගතවී බොහො දෙනෙකු හට
සතුටකි ලැබුම මව්බිම තතු දැන ගන්ට
ලංකාවිත්තියෙන් එය ඉටු කර දෙන්ට
වෙහෙසෙන කතුතුමනි ණයගැති වෙමු ඔබට

ඔබගේ විවේකය කාලය ශ්‍රමය සහා
ධනයද වැය කරන් දිව රෑ කරන මහා
මෙහෙයකි මව්බිමට ඇති සමුදුරෙන් එහා
තුති මල් එවමි ඔබ වෙත මඳ නල හරහා

දස මස් කුස දරා විඳ වේදනා රුදු
පණ මෙන් ඔබව ඇති දැඩි කළ මවද වැදූ
විලසම දිනූ මව්බිම කලකදි කිසිදූ
අමතක නොකරන්න පඩි වදනකි පසිඳූ

පවතින විවිධ තොරතුරු ලක්බිමෙන් සොයා
පළකර නිතර අප දැනුවත් කරන නියා
ලංකාවිත්ති ළං වන තුරු දෙනෙත් අයා
කාලය ගෙවමු අපි හදකින් පිරුණු දයා

එබැවින් සේවයක් ලෙස මව්බිම වෙනුවෙන්
ලංකා විත්තියට අත හිත දෙන්න තුටින්
කතුවරයින්ගෙ මෙහෙවර අගයා ඉහළින්
දායක වෙන්න ඔබ ලක් දරුවෙකු විලසින්

රසකවි දහම් ලිපි හා හරබර ලිපිද
ගෙන එන ළමා ලිපි හා උපදෙස් නිබඳ
තොරතුරු වලින් කාගෙත් පොබ කරන හද
ලංකාවිත්ති කුමරිය දිගු කල් සැරද!

***විශාමලත් විදුහල්පතිනි
අභාවප්‍රාප්ත
ප්‍රේමා අදිකාරි මහත්මිය***

**අවසාන වශයෙන් ලියා තැබූ කවි පන්තියයි
මේ. ලංකාවිත්ති පත්‍රයට යවන්නට යයි
ඇය තම දියණියට බාරදී තිබුණි.**
**Morden Surrey UK**

## ප්‍රේමා අදිකාරි කිවිඳිය වෙනුවෙනි

මියගිය පුවත අසමින් අපගෙන් වෙන්ව
ප්‍රේමා අදිකාරි මැතිනිගෙ ගුණ සිහිව
දැක්කේ නැති නමුත් හැබැහින් ඔබගෙ රුව
හඳුනමි හොඳින් ඔබ ලියු පැදි වැල් අනුව

ලංකාවිත්තියෙහි සුන්දර කවි පිටුව
මසකට වරක් ඔබගේ කවියෙන් ඔපව
අප වෙත ආ අයුරු සිහි වෙයි නිර තුරුව
අයියෝ ඉතින් පාළුයි කිවිඳිය නැතුව

**මේ පත්‍රයේ දුටු ඔබේ කවියකි**

පෙමතෝ ජායතී සෝකෝ බුදු වදන
සිහියට නගාගෙන සැනසුම ගෙන දෙවන
අතහැර දුක් දෙවන සිතිවිලි හඳ බැඳුණ
වෙහෙසෙමු ලබන්නට අජරාමර නිවන
- ***ප්‍රේමා අදිකාරි***

මේ වැනි බොදුනු අදහස් ගරුකරන හොඳ
සීයට කී දෙනෙක් අද ලොව සිටින වද
දූ දරු පිරිස ඇත ඔබෙ ඉහළින්ම අද
පින්වත් නිහතමානී මව් කෙනෙකි හොඳ

පුවත්පතින් දැන ගත්තත් වෙලා වට
අපි ගව් ගණන් දුර ඉන්නේ සැබෑ වට
අවසානය බලන්නට පින් නැතු වාට
පතනෙමු නිවන් සුව! මැතිනිට සැනසෙන්ට

රසවත් මෙන්ම හරවත් කවි ලියූ
ඔබතුමිය වෙනුවෙන් දුක්වන අප

♦ ***එස්. කංකානම්ගේ*** **London SE5**

## කාලයාගේ ඇවෑමෙන්

කාලය ඉගිල යද්දී නොදැනිම හිතට
දිනකදි මහළු විය එළඹිය හැක අපට
ගත සිත දෙකම බෙලහීනව ගිය කලට
මරුවා සිටිනු ඇත අප ළඟ තනි කමට

හැම මොහොතෙම අපේ අපටත් නොදැනි මැරේ
කාලය මැරී මැරී මළ මතකයට හැරේ
මළකුණුවලින් මතකය හැම විටම පිරේ
මළ මතකයන් පණ එනතෙකාට හරිම පොරේ

දන්නා කියන මළගිය අය හැම දෙනම
සිත තුළ සිටින්නේ පණපිටිනුයි තවම
වයසට නොයන නොමැරෙන ඒ අය සැවොම
ඒ ලොව රැදෙනු ඇත අප එහි එන තුරුම

මළවුන් නටන අප හිත රඟමඩ ලක්ය
ඒ අය රඟන්නේ අප එහි එන තෙක්ය
එනමුදු එරඟ සිත සනසන ඔසු වක්ය
මිය ගිය දාට ඒ සිත වුව සොහො නක්ය

අපගේ ගත සමග අපගේ සිත ද මැරෙයි
ගත සිත මෙහි දමා අප යා යුතුම තමයි
ගත මෙන් මතකයද මළ සොහොනකදි දැවෙයි
ඒවා බදා ඉන්නා තුරු දුකම තමයි

දුක මෙන් සහමුලින් දුක නැති වෙන නිවන
ඇත්තේ සිත තුළය නිති සිතුවිලි මවන
චෙතොවිමුත්තිය ඒ සිතුවිලි නහන
අප හට දිනක දෙයි අජරාමර සහන

♦ ***මහාචාර්ය ටී. එස්. අබේවික්‍රම***
**Harrow UK**

## හදිසි ඉර

උකුසු ඇස්වල නොගැටුණි
බාලයන් දුටුවේ නැති
දසුන් පඩිනට හුදෙකලාවෙන්
සිතාගන්නට බැරිවුණු

කළු වළාව පහවී
ගංතලාව දිලිසී
දර්පණයක සේමා
දියමත්ත දිළිසුණා

නැගණහිර මායිමේ
නිසංසල රළ කොණේ
නොසිතුව වෙලාවක
කවුරුවත් නෑ බලා

සැනින් රළ පෙළ දිළිසුණා
ගම් නියම් ගම් සිසාරා
නවෝදය නව හිරු එළිය වී
ඒකාලෝකව පැතිරුණා

♦ ***විකුම්ප්‍රිය පෙරේරා***
**USA**

## පුතේ! දෙනු මැන සමා

යකඩ කුරු අතරේ
මැරි මැරී ඉපදෙනා
මා දෙනෙත් අභියසේ
පුතේ නුඹෙ අවිහිංසක
සියුමැළි දෑස
නිමේශයකින් පිහිතුඩක් වී
සිදුරු කරයි මා ළය

දැනගත් දිනේම
නුඹ පිළිසිඳි බව
ගතේ මගෙ රුධිරය
පිටවුණා මා ගතින්
ජලබිඳු බවට පත් වී

මගේ පිළේ පැදුර මත
අතුළ සළුපිළ ද
ගෙනා ගජමුතු ද
ඔහු සුරතටම ගෙන
අභිනික්මන් කළා
වෙනත් මන්දිරයක
යස ඉසුරු ලැබගන්නට
නින්දා අපහාස ගැරහුම්
පමණක්ම
මා හට ඉතිරි කර
ඔහු බැබළවූ සමාජය
සැරසුවේය ඔහු ගත
සුදු වතින්
නින්දා සමච්චල් මැද
පැළඳුණිය මා සිරසට

වෛශ්‍යාවී කිරුළ

පුතේ ! මගේ අවිහිංසක
විරසක වූ ලෝකයක
අතරමං වීය මා
රෝගියෙකු වී මානසික
විපාකය ලෙසට එහි
ලගිමි සිර කූඩුවක

පුතේ සිටිනා ලොවින්
යොමා කරුණා දෙනෙත්
දෙනු සමා නුඹෙ මවට
මැරි මැරී ඉපදෙනා

♦ ***මොරීන් සී පෙරේරා***
**London W12**

## විරහ ගැයුම්

**බොහෝ කලක් මගේ සිතේ ඔබ සැඟවී උන්නා
පොහෝ දිනක පුර හඳ මෙන් සිතට එළිය දුන්නා
අ හෝ කිමද නොසිතු සේම මගෙන් ඈත් වෙන්නා
කොහෝ ම මම් ඉවසන්නද පපුව පැළී යන්නා**
**K.N.S** - ***London***

## පරණ බෝඩිම

පියවර නගන්නට අපහසු පුර වරෙහි
යන්තම් පය ගහන්නට පන්නරය දිදී
ගිමන් නිවන්නට උන්නා සේ පේවී
සසර අතර මග හමුවූ නැවතු මකී

සූකිරි විළඳ රස දිවගට නොදැනු නට
විල්ලුද යහන් නොලැබූ මුත් නිදි යන්ට
හැඩුව මුත් කඳුළු වගුරා පෙනෙන් නට
ජීවිත පොත ඇහින්දෙමි මිදි නොකි යන්ට

වියපත් වෙමින් අව් වැසි මැද සුළං සැරෙන්
දිනකට සියක් වර විවරව වැසෙන හඬින්
දුබලවූ ගේට්ටුව එපිටින් අඩි තිය මින්
කී සීයක් දූ වරු වෙන් වුණිද නුඹෙන්

අහසින් දෙව් විමන් වූවත් පලක් නැතී
පොළවෙන් මාළිගා වූවත් නිමක් නැතී
තුන් සක්වලම රන් කහවනු කුමට වටී
නුඹ හැඟ වූ ජීවිත පොත තරම් සකී

♦ ***කුසුමිණි කීර්ති කුමාරි*** **Sri Lanka**